## 335 මිහිරි මැ වේ සිත

මිහිරි මැ වේ සිත ඔබ සිහි කරනා
හදවතෙ නැගැයේ සොම්නස් උතුරා
ඉමිහිරි කොයි දේටත් වැඩි මිහිරේ
ඇසුර ඔබේ මට ජේසුනි ලබදේ

ළතැවෙන්නන් හට සැනැසිලි සඳහා
අයැදින්නන් හට මහ මෙත පිණිසා
සොයනුන් හට ගුණ කඳක් මැ විසිනා
ඇයි හමුවනුනට ජේසුව මැ මදැ

දෙව්සුරු පුත් පිය ජේසුට වැඩියේ
මනහර කිසිවක් හෙම නැ ගැයුණේ
කන් පිනවන මොනවත් හෝ ඇසුණේ
පියතර හෝ කිසි නැ සිතෙ නැගුණේ

දිවෙකින් කියනට පුළුවන්කම් නැ
අකුරෙන් අඟවා ලන්නට හෙම බැ
ඇලුනොත් පමණක් ජේසුන් කෙරෙහී
එහි රස පසක්වැ ගතහැකි අදහා

ඔබ මැයි ජේසුනි ඔඳ තොස හදපේ
මතු එන දවසේ පිලිලබ අපගේ
ඔබ මැ කෙරේ වේ අපගේ මහිමේ
ගෙවී නොයන්නා හැම කල් තිස්සේ